# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2259/25 – 2021 දෙසැම්බර් 23 වැනි බ්‍රහස්පතින්දා – 2021.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2049/5 හා 2017.12.11 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2017 අංක 307 හා 2017.11.22 වැනි දින දරන ආඥාවේ පහත සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2049/5 හා 2017.12.11 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2017 අංක 307 හා 2017.11.22 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2017/CA/30.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය:
RAT/LAN/10/F1/10.
2021 දෙසැම්බර් මස 08 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,අත්තිඩිය දකුණ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක CO/RTM/2017/233 හා 2017.11.01 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1716 ක් පමණ වන ඉඩම් කැබැල්ලට මායිම්.

01. **කැබලි අක්ෂර 'A' – ද සොයිසා වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1716 ක් පමණ**

උතුරට: ක.සි. 521002, කලාප 11 හි කැබලි අංක 47, 48, 51, 52 සහ 54; නැගෙනහිරට: ක.සි. 521002, කලාප 11 හි කැබලි අංක 54, 56, 59 සහ 60; දකුණට: ක.සි. 521002, කලාප 11 හි කැබලි අංක 60, 61, 62, 63 සහ 42; බටහිරට: ක.සි. 521002, කලාප 11 හි කැබලි අංක 42, 43, 44, 46 සහ 47.

EOG 12 - 0237